සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 | S | I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
# First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................ චිත්‍ර කලාව - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

l පහත සඳහන් පින්තූරය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. මෙම සිතුවම නූතනවාදී කලා භාවිතය සහිත නිර්මාණයක් වන අතර ............................................ නමින් හැඳින්වේ.

2. සිතුවම නිර්මාණය කළ ශිල්පියා වන්නේ ............................................ මහතාය.

3. අඳුරු හා ............................................ වර්ණ සාර්ථකව යොදමින් රාත්‍රී කාලය නිරූපණය කර ඇත.

4. රේඛාකරණයට වඩා ............................................ හැසිරවීමෙන් රූපක මතු කර දැක්වීමට ශිල්පියා උත්සාහ දරා ඇත.

5. පෙරබිම, පසුබිම නොසලකා ............................................ රූප සම්පිණ්ඩනය කළද වර්ණ කිරීමේ ශිල්ප ක්‍රමය අනුව පෙරබිම, මැදබිම, පසුබිම සංවිධානගතව ස්ථාන ගත කර චිත්‍රයේ ගැඹුර දක්වා ඇත.

l අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර ලියන්න.

6. ශ්‍රී ලංකාවේ පැරණි කලා ශිල්පීන් ඉර හා හඳ රූප සටහන් යෙදීමෙන් සංකේතවත් කළේ කුමක් ද?............................................

............................................

7. ලක්දිව ප්‍රථම ස්තූපය හැටියට පිළිගැනෙන ථූපාරාමයේ මුල් හැඩය කුමක් ද?............................................

8. දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ලක්ෂණ සහිතව ගම්පල යුගයේ ඉදි වූ ගඩලාදෙණිය විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා කවු ද? ..............................................................................................................................................................

9. සාම්ප්‍රදායික පොල්තෙල් පහන තබන තැන බිම යොදන සැරසිල්ල හඳුන්වන නම කුමක් ද? ........................................................................................

10. ''තණ පිටියේ මැඩෝනා'' නැමැති ලෝ සුපතල සිතුවම නිර්මාණය කර ඇත්තේ කුමක් මතද? ..........................................

l **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ගද්‍ය හෝ පද්‍ය නිර්මාණයක අදහස තීව්‍ර වන සේ අඳිනු ලබන චිත්‍ර හඳුන්වන්නේ,
    - (1) පෝස්ටර් චිත්‍ර නමිනි
    - (2) සන්නිදර්ශන චිත්‍ර නමිනි.
    - (3) ග්‍රැෆික් චිත්‍ර නමිනි
    - (4) ප්‍රකාශන චිත්‍ර නමිනි

12. ''විරැකියාව'' නැමැති සිතුවම අඳින ලද්දේ,
    - (1) ඩේවිඩ් පේන්ටර් මහතාය
    - (2) සෝලියස් මෙන්ඩිස් මහතාය.
    - (3) A. C. G. S. අමරසේකර මහතාය
    - (4) H. A. කරුණාරත්න මහතාය.

13. අවුකන පිළිමයේ දක්නට ඇත්තේ,
    - (1) ගන්ධාර කලා ලක්ෂණ ය
    - (2) ගුප්ත කලා ලක්ෂණ ය
    - (3) මථුර කලා ලක්ෂණ ය
    - (4) අමරාවතී කලා ලක්ෂණ ය

14. ඉන්දියාවේ මොහෙන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරයෙන් හමු වූ පූජක රුව නිර්මාණය කොට ඇත්තේ,
    - (1) කළුගලිනි
    - (2) සුදු හුණුගල් විශේෂයකිනි
    - (3) රතු වැලි ගලිනි
    - (4) ලෝකඩ මාධ්‍යයෙනි.

15. තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා ගේ නිර්මාණයක් වන්නේ,
    - (1) ඇතා වල්ලිව එළවාගෙන යාම
    - (2) අගස්තියර් හා විනායගර්
    - (3) සුදු කුකුළාගේ රූපය
    - (4) මිනිසා සහ බල්ලන්

l **අංක 16 - 20 තෙක් හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර සපයන්න.**

16. පැරණි ශිල්පීන් සිතුවම් නිර්මාණයේ දී රතු වර්ණය සඳහා ........................................................................... නැමැති ආනයනික ඛනිජ වර්ගය යොදාගෙන ඇත.

17. දේශීය සම්භාව්‍ය චිත්‍ර කලාව හා නූතන චිත්‍ර කලාවේ ආභාෂය ලබමින් බුද්ධ චරිතයේ සිදුවීම් තේමා කරගෙන ............ ..................................................................................... විහාරයේ සිතුවම් නිර්මාණය කළේ ජෝර්ජ් කීට් මහතාය.


18. වසර 33ක කාලයක් පුරා ''සිරිත්තිරන්'' නැමැති පුවත් පත පළ කරමින් එම පුවත් පතට කාටූන් චිත්‍ර ඇඳි ..................... ....................................................................................................... මහතා සිරිත්තිරන් සුන්දර් ලෙසින්ද ප්‍රසිද්ධියට පත්විය.

19. ශ්‍රී ලංකාවේ කාටූන් කලාවේ පුරෝගාමියා ලෙස .......................................................................................... මහතා හැඳින්විය හැකි අතර ඔහු 43 කණ්ඩායමේ ශිල්පියෙකි.


20. සීගිරි සිතුවම්වලින් කුවේරයාගේ දියණියන් වන මේඝලතා හා විජ්ජුලතා සංකේතවත් වන බව .................................... ....................................................................... මහතා ප්‍රකාශ කළේය.


l අංක 21 සිට 25 දක්වා දී ඇති රූපසටහන්වලට ගැළපෙන A, B, C, D, E යන රූපවලින් ගැළපෙන රූපය තෝරා ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21.  (..............................)  A

22.  (..............................)  B

23.  (..............................)  C

24.  (..............................)  D

25.  (..............................)  E

l ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

26. ටෙම්ප්ලේට් - ..............................................................................................................
..............................................................................................................

27. වලිච්චි ..............................................................................................................
..............................................................................................................

28. මිනාර් ..............................................................................................................
..............................................................................................................

29. උෂ්ණීෂය - ..............................................................................................................
..............................................................................................................


30. භද්‍රාසනය- ..............................................................................................................
..............................................................................................................

l **ප්‍රශ්න අංක 31සිට 35 තෙක් ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන්නේ ලක්දිව කලාත්මක මුරගලයි. මෙම මුරගල අයත්වන යුගය කුමක් ද?
..............................................................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා කවු ද?..............................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවු ද? ..............................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන කාන්තා රූප ගලපමින් කර ඇති මෙම සැරසිල්ල හඳුන්වන නම කුමක් ද?
..............................................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමයේ දෑතින් දැක්වෙන මුද්‍රාව කුමක් ද? ..............................................................................

l **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා රූප සටහන ඇසුරු කර ගනිමින් උප ශීර්ෂවලට අනුව වාක්‍ය පහක් (05) ලියන්න.**



36. හඳුනාගත් බව ..............................................................................................................

37. මාධ්‍ය හා ශිල්ප ක්‍රමය ..............................................................................................................

38. යුගය ..............................................................................................................

39. කලා සම්ප්‍රදාය ..............................................................................................................

40. භාව ප්‍රකාශනය ..............................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 | S | II

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................... චිත්‍ර කලාව - II කාලය : පැය 02යි.

**සැලකිය යුතුයි.**

l ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලි ව සටහන් කරන්න.

l උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.

l දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකි ය.

l සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ සම්පිණ්ඩනය**

l ඔබ ඉදිරියේ තබාඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිතා කරන්න.

2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

l මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

l ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

l **රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා

l **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.

3. පරිමාණ, පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය.

4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.

5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව.

6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව.

*සැලකිය යුතුයි:*

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමානය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 S III

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................ චිත්‍ර කලාව - III කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙනවිට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැක. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේදී පමණි. )(පළාත් මට්ටමේදී තමන් විසින් සපයා ගත යුතුය.)

---

''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### ''අ'' කොටස චිත්‍ර සංරචනය

01. කෙතෙහි ගොයම් කපන ගොවි ගෙවිළියෝ.

02. සුවඳ මල් ගෙන බුදු පුදට යන උපාසක උපාසිකාවෝ

03. සත්තු වත්තේ සතුන් නරඹන පිරිසක්

04. ''බතේ උපත'' සාම්ප්‍රදායික හා ශෛලිගත චිත්‍ර සංරචක ක්‍රම භාවිත කරමින් නව නිර්මාණාත්මක චිත්‍රයක් අඳින්න.

### ''ආ'' කොටස මෝස්තර නිර්මාණය

05. සත්ත්ව, පක්ෂි හෝ මත්ස්‍ය රූප ඇසුරුකර ගනිමින් ළමා රෙදි සඳහා උචිත ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

06. වියුක්ත හැඩ හා ජ්‍යාමිතික හැඩ භාවිත කරමින් කාන්තා කුඩ රෙද්දකට මෝස්තරයක් නිර්මාණය කරන්න.

07. නිවස තුළ අලංකරණය සඳහා භාවිතයට ගත හැකි කලාත්මක බඳුනක් නිර්මාණය කරන්න.

### ''ඉ'' කොටස ග්‍රැෆික්

08. කියවීමෙහි අගය දක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න.

09. කිරිපිටි වර්ගයක් ප්‍රචාරය කිරීමට වෙළෙඳ සැල්වල එල්ලා තැබීමට සුදුසු චලනමය ප්‍රචාරක දැන්වීමක් සැලසුම් කරන්න.

10. පාසලේ ක්‍රීඩා උත්සවය සඳහා සකස් කෙරෙන සමරු කලාපයට සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න.

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

43 | S | I - II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

### චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පෙරහැර/දළදා පෙරහැර | 11. | (2) සන්නිදර්ශන චිත්‍ර | 21. | E |
| 2. | ස්ටැන්ලි අබේසිංහ | 12. | (3) A. C. G. S. අමරසේකර | 22. | D |
| 3. | ආලෝකමත් වර්ණ | 13. | (4) අමරාවතී කලා ලක්ෂණ | 23. | A |
| 4. | වර්ණ මාධ්‍ය | 14. | (2) සුදු හුණුගල් විශේෂයකිනි. | 24. | B |
| 5. | එකම තලයක | 15. | (3) සුදු කුකුළාගේ රූපය | 25. | C |
| 6. | සදාකාලික බව/ස්ථිර බව | 16. | සාදිලිංගම් | | |
| 7. | ධාන්‍යාකාර | 17. | බොරැල්ලේ ගෝතමී | | |
| 8. | ගණේශ්වරාචාර්ය | 18. | සී. සිවඥානසුන්දරම් | | |
| 9. | අල්පනාව | 19. | ඕබ්රි කොලට් | | |
| 10. | ලී පුවරුවක් මත | 20. | සෙනරත් පරණවිතාන | | |

26. හැඩතලයක් මත පැස්ටල් තවරා ඇඟිල්ලෙන් මැදීමේ ශිල්ප ක්‍රමය
27. බිතු සිතුවම් වල ආරක්ෂාව සඳහා ගාන ලද ආලේපනය
28. මුස්ලිම් දේවස්ථාන දෙපස ඉහළට විහිදුනු කුලුනු
29. අක් බමරු සහිත කේෂ නිරූපණය සමග මඳක් උස් කොට බැඳි කොණ්ඩය කොටස
30. මඳක් උස් වූ කෙටි ආසනයක් මත වැඩ සිටින ආකාරය. (නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.)
31. අනුරාධපුර යුගය
32. ඩබ්ලිව්. ආර්. විජේසෝම
33. G. S. ප්‍රනාන්දු
34. නව නාරී කුඤ්ඤරය
35. පර දුක්ඛ දුක්ඛිත මුද්‍රාව
36. මෙහි දක්වෙන්නේ අභයගිරි විහාර භූමියට අයත් මහමෙවුනා උයනෙහි ඇති සමාධි බුදු පිළිමයයි.
37. කළුගල් මාධ්‍යයෙන් නෙලීමේ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.
38. අනුරාධපුර යුගයට අයත් වේ.
39. මෙම පිළිමය ගුප්ත කලා සම්ප්‍රදායට අයත්ය.
40. අධ්‍යාත්මික ශක්තිය, සමාධි ගුණය, මහා කරුණාව, උපශාන්ත භාවය මැනවින් දක්වන පිළිමයකි.

(පිළිතුරකට ලකුණ 01 බැගින් 1 = ලකුණු 40)

II කොටස ස්වභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය

**ලකුණු දීමේ නිර්නායක**

| | | |
|---|---|---|
| 01. | ද්‍රව්‍ය අධ්‍යයනයේ දී නිදහස්ව අර්ථවත්ව රේඛාව හැසිරවීම | ලකුණු 05 |
| 02. | තලය අර්ථවත්ව හැසිරවීම | ලකුණු 05 |
| 03. | පරිමාණය හා ගති ස්වභාවය | ලකුණු 05 |
| 04. | සිද්ධාන්ත භාවිත අවබෝධය පර්යාවලෝකනය, සනත්වය, ඇස්මට්ටම) | ලකුණු 05 |
| 05. | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | ලකුණු 05 |
| 06. | සමස්ත නිමාව/පසුබිම දැක්වීම | ලකුණු 05 |
| | | ලකුණු 30 |

**Answer**

## III පත්‍රය ''අ'' කොටස චිත්‍ර සංරචනය

ලකුණු දීමේ නිර්නායක

| | |
|---|---|
| (1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු | ලකුණු 06 |
| (2) මානව හා සත්ත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු | ලකුණු 06 |
| (3) රේඛාවේ හා හැඩතලවල පරිණත බව | ලකුණු 06 |
| (4) වර්ණ භාවිතයේ කුසලතාව | ලකුණු 06 |
| (5) සමස්ත නිමාව | ලකුණු 06 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | ලකුණු 30 |

## III පත්‍රය ''ආ'' කොටස මෝස්තර හා සැරසිලි නිර්මාණය

| | |
|---|---|
| (1) මාතෘකාවට හා කාර්යයට උචිතව නවතාවයකින් යුතුව සැලසුම් කිරීම | ලකුණු 06 |
| (2) පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව | ලකුණු 06 |
| (3) හැඩතල සම්පිණ්ඩනය හා නිර්මාණාත්මක බව | ලකුණු 06 |
| (4) වර්ණ තෝරා ගැනීම හා භාවිතය | ලකුණු 06 |
| (5) විචිත්‍රත්වය, චමත්කාර බව, නිර්මාණයේ සාර්ථක බව | ලකුණු 06 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | ලකුණු 30 |

## III පත්‍රය ''ඉ'' කොටස ග්‍රැෆික් චිත්‍ර

| | |
|---|---|
| (1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම | ලකුණු 06 |
| (2) වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා මුද්‍රණයට උචිත බව | ලකුණු 06 |
| (3) රේඛා හැඩතල හා සැරසිලි අර්ථවත්ව යෙදීම | ලකුණු 06 |
| (4) උචිත වර්ණ භාවිතය | ලකුණු 06 |
| (5) විචිත්‍රත්වය, චමත්කාරජනක බව හා නිර්මාණයේ සාර්ථකත්වය | ලකුණු 06 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | ලකුණු 30 |